ආයතනයේ නම - සංචාරක අමාත්‍යාංශය

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119 (4) යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.

நிறுவனத்தின் பெயர் – சுற்றுலா அமைச்சகம்

பாராளுமன்றத்தின்அரசாங்க கணக்குகள் தொடர்பான குழு சமர்பித்த அறிக்கைகள் தொடர்பாக நிலையியற் கட்டளை எண் 119 (4) இன்பிரகாரம் கௌரவ அமைச்சரின் அவதானங்கள் மற்றும் அவை தொடர்பில் எடுக்கப்பட்ட நடவடிக்கைகள் பற்றிய சமர்ப்பிப்பு

Name of the institution – Ministry of Tourism

Submission of observations of Hon.Minister and steps taken with regard to the reports tabled by the committee on Public Accounts in terms of Standing order No 119 (4)

CamScanner

අංකය	කමිටුව විසින් හඳුනා ගන්නා ලද අඩුපාඩු / ලබා දෙන ලද උපදෙස්	අඩුපාඩු නිවැරදි කිරීමට/නිර්දේශ ක්‍රියාත්මක කිරීමට ආයතනය විසින් ගන්නා ලද ක්‍රියාමාර්ග / වත්මන් තත්ත්වය
1කොටස 81:00 01	පාඩු පිළිබඳ ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන ගොස් නොතිබුණි.	රිය අනතුරුවලට අදාළ විමර්ශන කටයුතු අවසන් කර නොතිබුණද, ඉදිරි වර්ෂවල ගිණුම්ගත කළ යුතු සිදුවීම් හෝ අපේක්ෂිත පාඩු අතහැර දැමීමේ ප්‍රමාණය හෝ එම ප්‍රකාශනයේ වාර්තා කළ යුතුව තිබුණද, එය අතපසු වීමකින් මහ හැරී ඇති අතර, අනාගතයේදී එවැනි අතපසු වීම් සිදු නොවන බවට සහතික කෙරේ.
02	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර නොතිබුණි.	2021වර්ෂය සඳහා වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර ඇත.
03	ඉහත වක්‍රලේඛයේ 13වන ඡේදය ප්‍රකාරව වක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය කිරීම සඳහා පත් කරන ලද සුදුසු සම්බන්ධීකරණ නිලධාරියාගේ සහ නම් කරන ලද නිලධාරියාගේ විස්තර කොමිසේට්‍රාල් ජනරාල් කාර්යාලයට යවා නැත.	ඉහත වක්‍රලේඛයේ 13වැනි ඡේදය ප්‍රකාරව වක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය කිරීම සඳහා පත් කරන ලද සුදුසු සම්බන්ධීකරණ නිලධාරියාගේ සහ නම් කරන ලද නිලධාරියාගේ විස්තර කොමිසේට්‍රාල් ජනරාල් කාර්යාලයට යවන ලදී.
04	සංචිත වාහනවල දෛනික ධාවන සටහන් වාර්තා සහ මාසික සාරාංශ වාර්තා සකස් කර විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර නැත.	සංචිත වාහනවල සම්පූර්ණ කරන ලද දෛනික ධාවන සටහන් වාර්තා සහ මාසික සාරාංශ වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කරන ලදී.
05	එක් එක් වාහනය සඳහා වාහන ලොග් පොත් නඩත්තු කර යාවත්කාලීන කර නොතිබුණි. 2016.12.29 දිනැති රාජ්‍ය පරිපාලන වක්‍රලේඛ අංක 30/2016 හි 3.1 ඡේදයේ විධිවිධාන ප්‍රකාරව, අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව සතු වාහනවල ඉන්ධන පරිභෝජනය නැවත පරීක්ෂා කර නොමැත.	රාජ්‍ය පරිපාලන වක්‍රලේඛ අංක 30/2016අනුව ඉන්ධන දහන පරීක්ෂණය නියමිත කාලය තුළ ම මේ වන විට සිදු කෙරෙමින් පවතී. 2021 වර්ෂය සඳහා ඉන්ධන දහන පරීක්ෂණය එම වසරේ පෙබරවාරි සහ මාර්තු මාසවලදී පවත්වන ලදී.
06	මු.රෙ.94(1) ප්‍රකාරව වසර අවසානයේ ඉතිරිව ඇති ප්‍රතිපාදන ඉක්මවන බැරකම් දරා තිබුණි.	ඇස්තමේන්තුගත ප්‍රමාණයට වඩා වැඩි ප්‍රතිපාදන වසර අවසානයේ දී ඉතිරිව ඇත්නම් පමණක් බැදීම් දැරිය යුතු නමුත්,අමාත්‍යාංශයේ වැය විෂයයන් 12ක් යටතේ සිදු කළ යුතු අත්‍යාවශ්‍ය සහ වැදගත් වියදම් කිහිපයක් දැරීම හේතුවෙන් ප්‍රතිපාදන ඉක්මවා ණය ප්‍රමාණයක් පවතින අතර මෙම තත්ත්වය ඉදිරියේදී පාලනය කරනු ලැබේ.
07	වාර්ෂික කාර්ය සාධන වාර්තාව සකස් කර නියමිත දිනට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර නොතිබුණි.	වාර්ෂික කාර්ය සාධන වාර්තාව සකස් කර 2020.08.10 වන දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.
2 කොටස 31:00 01	මහජනතාව විසින් කරන ලද ඉල්ලීම්වලට ප්‍රතිචාර වශයෙන් සපයන ලද / ලබා නොදුන් තොරතුරු පිළිබඳ සටහන් තබා ගැනීම සඳහා ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි.	මෙම අමාත්‍යාංශය සාමාන්‍යයෙන් මහජනතාව සමඟ සෘජු සබඳතා නොපවත්වයි.
02	මහජනතාවට අවශ්‍ය තොරතුරු ලබා නොදීම සම්බන්ධයෙන් ලැබුණු පැමිණිලි ලේඛනගත කිරීමට සහ එම පැමිණිලි සම්බන්ධයෙන් ගෙන	එවැනි මහජන පැමිණිල්ලක්/ඉල්ලීමක් ලැබුණහොත්, එය අදාළ ආයතනය වෙත යොමු කරනු ලැබේ. එම මහජන පැමිණිලි/ඉල්ලීම්වල සාරාංශ ඩිජිටල්

CamScanner

	ඇති ක්‍රියාමාර්ග පිළිබඳ පැහැදිලි කිරීම් ලබා දීමට වාර්තා පවත්වා ගෙන ගොස් නොතිබුණි.	ආකාරයෙන් පවත්වා ගෙන යනු ලැබේ.
03	ආයතනය තම විෂය පථයට අදාළ තිරසාර සංවර්ධන ඉලක්ක හඳුනා ගැනීමට අපොහොසත් වී ඇත.	2018 වසරේ සිට අමාත්‍යාංශය තිරසාර සංවර්ධන ඉලක්ක සහ දර්ශක (SDG8, SDG12 සහ SDG14) සාක්ෂාත් කර ගැනීම සඳහා දර්ශක හඳුනාගෙන ඇත.
04	හඳුනාගත් තිරසාර සංවර්ධන ඉලක්කවල සාක්ෂාත් කර ගැනීමේ මට්ටම මැනීමට හැකි කාර්ය සාධන ඉලක්ක සකස් කර නොතිබුණි.	වාර්ෂික කාර්ය සාධන වාර්තාව සහ ගිණුම් -2020 මඟින් තිරසාර සංවර්ධන ඉලක්කවල (SDG8, SDG12 සහ SDG14) සහ සංචාරක අංශයේ ප්‍රධාන කාර්ය සාධන දර්ශකවල වත්මන් ප්‍රගතිය අනාවරණය කර ඇත.
05	ආයතනයට අදාළ තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමට අදාළ විශේෂිත පාර්ශ්වයන් හඳුනාගෙන නොතිබුණි.	තිරසාර සංවර්ධන ඉලක්ක සහ දර්ශක සාක්ෂාත් කර ගැනීම සඳහා අමාත්‍යාංශය විසින් අදාළ පාර්ශවයන් මෙන්ම විශේෂිත දර්ශක ද 2018 වසරේ සිට හඳුනාගෙන ඇත.
06	තිරසාර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශයේ 2018.04.27 දිනැති අංක MSDW/08/65 දරන වක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූලව තිරසාර සංවර්ධන ඉලක්කවලට අදාළ කටයුතු සම්බන්ධීකරණය කිරීම සඳහා පත් කළ යුතු නියෝජිතයින් දෙදෙනෙකු නම් කර ආයතනය විසින් එම නම් එකී අමාත්‍යාංශයට වාර්තා කර නොතිබුණි.	තිරසාර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශයේ 2018.04.27 දිනැති අංක MSDW/08/65දරන වක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූලව තිරසාර සංවර්ධන ඉලක්කවලට අදාළ කටයුතු සම්බන්ධීකරණය කිරීම සඳහා සංචාරක සහ ඉඩම් අමාත්‍යාංශය විසින් නියෝජිතයන් දෙදෙනෙක් පත් කර ඇත.
07	පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය නිසි ලෙස සකස් කර හෝ නිසි පරිදි යොදාගෙන නොතිබුණි.	අමාත්‍යාංශ ක්‍රියාකාරකම්වලට බොහෝ දුරට සාමාන්‍ය ජනතාව සෘජුව සම්බන්ධ නොවන නමුත් අභ්‍යන්තර සේවාලාභීන් සඳහා (අමාත්‍යාංශයේ සහ මෙම අමාත්‍යාංශය යටතේ ඇති අනෙකුත් ආයතනවල) පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය සකස් කරමින් පවතින අතර එය 2023 වසර සඳහා සකස් කිරීමට පියවර ගෙන ඇත.
08	ආයතනය විසින් පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය යොදා ගැනීම අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.	පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය සහ ඇගයීම සඳහා ක්‍රමවේදයක් සකස් කරමින් පවතින අතර එය 2023 වසර වන විට ක්‍රියාත්මක කිරීමට පියවර ගෙන ඇත.
09	සම්පූර්ණ කාර්ය මණ්ඩලය ආවරණය වන පරිදි කාර්ය සාධන ගිවිසුම් කෙටුම්පත් කර හෝ ගිවිසුම්වලට එළඹ නොතිබුණි.	කාර්ය සාධන ගිවිසුම් සකස් කිරීම ආරම්භ කර ඇති අතර තවමත් අවසන් කර නොමැත.
10	අයවැය වක්‍රලේඛයට අනුව ආයතනය අවම වශයෙන් නිමැවුම් දර්ශක තුනක් හඳුනාගෙන ලේඛනගත කර නොතිබුණි.	අයවැය වක්‍රලේඛයට අනුව නිමැවුම් දර්ශක හතරක් අමාත්‍යාංශය විසින් හඳුනාගෙන ඇත. 01. වැඩිදියුණු කරන ලද සංචාරක පහසුකම්. 02. ආගන්තුක සත්කාර කර්මාන්තයේ පුහුණුව ලැබූ තරුණයින් සංඛ්‍යාව. 03. සංවර්ධනය කරන ලද ප්‍රජා පාදක සත්කාරක නිවාස සහ ගම්මාන සංඛ්‍යාව. 04. සංවර්ධනය කරන ලද උරුම ස්ථාන සංඛ්‍යාව.
11	ආයතනයේ කාර්යයන් සම්බන්ධයෙන් ප්‍රධාන කාර්ය සාධන දර්ශක තුනක් ආයතනය විසින් හඳුනාගෙන නොතිබුණි.	ආයතනයේ කාර්යයන්ට අදාළව ප්‍රධාන කාර්ය සාධන දර්ශක පහක් අමාත්‍යාංශය විසින් හඳුනාගෙන ඇත. 01. සංචාරක පැමිණීම් සංඛ්‍යාව මිලියන 2.2 සිට මිලියන 4.0 දක්වා වැඩි කිරීම.

CamScanner

		02. සංචාරක ආදායම ඇමෙරිකානු ඩොලර් බිලියන 3 සිට බිලියන 7 දක්වා වැඩි කිරීම. 03. සංචාරක කර්මාන්තය ආශ්‍රිත විදේශ ආයෝජන ඇමෙරිකානු ඩොලර් බිලියන 3 දක්වා වැඩි කිරීම. 04. සෘජු හා වක්‍ර රැකියා අවස්ථා 600,000ක් උත්පාදනය කිරීම. 05. රට තුළ සංචාරකයෙකු රැඳී සිටින දින ගණන දින 7 සිට දින 12 දක්වා වැඩි කිරීම.
12	හඳුනාගත් පළමු කාර්ය සාධන දර්ශකයේ සාක්ෂාත් කර ගැනීම 50%ට වඩා අඩු විය. හඳුනාගත් දෙවන කාර්ය සාධන දර්ශකයේ සාක්ෂාත් කර ගැනීම ද 50%ට වඩා අඩු විය. හඳුනා ගත් තෙවන කාර්ය සාධන දර්ශකයේ සාක්ෂාත් කර ගැනීම ද 50% ට වඩා අඩු විය.	කොවිඩ්-19 වසංගත තත්වය පැතිරයාම හේතුවෙන් හඳුනාගත් කාර්ය සාධන දර්ශක පහේ සාක්ෂාත්කර ගැනීම 50%ට වඩා අඩු විය. හඳුනාගත් දර්ශක හතරක් 50%ට වඩා වැඩිකාර්ය සාධනයක් සාක්ෂාත්කර ගෙන ඇත.

හරින් ප්‍රනාන්දු
සංචාරක හා ඉඩම් අමාත්‍ය

CamScanner